# ආපනශාලා සඳහා මිල ගණන් කැඳවීම

## කැලණිය විශ්වවිද්‍යාලය - කැලණිය

කැලණිය විශ්වවිද්‍යාලයේ 2017/2018 අධ්‍යයන වර්ෂය (2019 වර්ෂය) සඳහා පහත සඳහන් ශිෂ්‍ය ආපනශාලාවන් පවත්වාගෙන යාම පිණිස ප්‍රමාණවත් මූල්‍ය වත්කම් සහ අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ඇති පුද්ගලයන්ගෙන් හෝ ආයතනවලින් මිල ගණන් කැඳවනු ලැබේ.

- වෛද්‍ය පීඨ ප්‍රධාන ආපනශාලාව
- පරිගණක හා තාක්ෂණ පීඨ ආපනශාලාව
- කළමනාකරණ පීඨ ආපනශාලාව

ටෙන්ඩර් ආකෘති පත්‍ර සහ ඊට අදාළ අනෙකුත් විස්තර **2019.01.17 දින සිට 2019.02.06 දින** තෙක් සතියේ දිනවලදී පෙ.ව.8.30 සිට ප.ව. 3.00 දක්වා ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ශිෂ්‍ය සේවා වෙතින් ලබාගත හැකි අතර, ඒ සඳහා **ආපසු නොගෙවනු ලබන රු. 500/- ක ටෙන්ඩර් තැන්පත් මුදලක්** විශ්වවිද්‍යාලයේ සරප් වෙත ගෙවා රිසිට්පත ඉදිරිපත් කළ යුතුය.

නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත් බහාලූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ ටෙන්ඩරයේ නම සඳහන් කර මුද්‍රා තබා 2019.02.07 වන දින පෙරවරු 10.00ට පෙර ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ශිෂ්‍ය සේවා වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ **විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සේවා අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට** බහාලීම කළ යුතුය. එදිනම පෙ.ව. 10.30 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. වැඩි විස්තර අංක 011 2903125 දුරකථන ඔස්සේ ශිෂ්‍ය සේවා අංශයෙන් ලබා ගත හැක.

ලේඛකාධිකාරී
කැලණිය විශ්වවිද්‍යාලය
2019.01.16

ශිෂ්‍ය සේවා අංශය
2019.01.11

ලේඛකාධිකාරී

කැලණිය විශ්වවිද්‍යාලය

## පුවත්පත් දැන්වීමක් පළකිරීම

2017/2018 (2019) අධ්‍යයන වර්ෂය සඳහා **වෛද්‍ය පීඨ ආපනශාලාව, පරිගණක හා තාක්ෂණ පීඨ ආපනශාලාව සහ කළමනාකරණ පීඨ ආපනශාලා** පවත්වාගෙන යාමට සුදුසු කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමට තීරණය කර ඇත. ඒ අනුව මේ සමග අමුණා ඇති පුවත්පත් දැන්වීම 2019.01.16 බදාදා දින **දිනමිණ, ලංකාදීප, තිනකරන්** සහ 2019.01.20 ඉරිදා දින **ඔබ්සවර්** (ඉංග්‍රීසි භාෂාවෙන්) පුවත්පත්වල පළකිරීම සඳහා අවශ්‍ය අනුමැතිය දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී

ශිෂ්‍ය සේවා